www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඉවෝ මොරාලේස් සහ බොලිවියාවේ 'ජනසතු කිරීමේ' වංචාව

## Evo Morales and the fraud of "nationalization" in Bolivia

**ජෙයාර් ඇන්ටුනේස් විසිනි**
**2007 මැයි 22**

බොලිවියාවේ ජනාධිපති වන ඉවෝ මොරාලේස් මෙම මස මුල දී ජනමාධ්‍යවලට සාඩම්බර ප්‍රකාශයක් කරමින් එම රටෙහි තෙල් සහ ස්වභාවික ගෑස් කර්මාන්ත ජනසතු කිරීමට ඔහුට තිබූ සැලසුම් ක්‍රියාත්මක කිරීම ප්‍රකාශයට පත් කලේ ය. මෙම ව්‍යවසායන් 1990 ගනන්වල දී ලතින් ඇමරිකාව තුල දී ම කරනු ලැබූ "නව ලිබරල් හැඩ ගැසීම" තුල දී පුද්ගලීකරනය කර තිබින. මොරාලේස්ට අනුව, බොලීවියානු ජනතාව තම රටේ පොලොව යට ඇති ස්වභාවික ධනයේ සැබෑ අයිතිකරුවන් ලෙස ක්‍රියාකිරීමට පටන්ගෙන ඇත්තේ දැන් ය .

එහෙත් මොරාලේස් බොලීවියාව තුල ඇත්තෙන් ම කරන්නේ තම රටේ ක්‍රියාත්මක වූ විදේශීය සමාගම් ඓතිහාසික අර්ථයකින් ගත් කල ජනසතු කිරීම නොවේ. ඔහු ඇත්ත වශයෙන් කරන්නේ කලින් රජය සතු කර තිබී පසු ගිය දශකය තුල පුද්ගලීකරනය කරන ලද ව්‍යවසායයන් ආපසු මිල දී ගැනීමයි.

මොරාලේස් විසින් හුවා දක්වනු ලැබෙන මෙම ජනසතු කිරීම්වල වංචාකාරීත්වය වඩා හොඳින් වටහා ගත හැක්කේ පෙට්‍රෝබ්‍රාස් නමැති බ්‍රසීලයේ රාජ්‍ය සතු තෙල් සමාගම විසින් 1990 ගනන්වල දී මිලදී ගනු ලැබූ තෙල් පිරිපහදු දෙකක් ආපසු මිලදී ගැනීම විභාග කර බැලීමේ දී ය. බොලීවියාවේ තෙල් කැනීම, පිරිපහදු කිරීම සහ බ්‍රසීලය තුල බෙදා හැරීම අරමුනු කර ගනිමින් බ්‍රසීලියානු ප්‍රාග්ධනය මගින් මුදල් යොදවා 1996 පෙට්‍රෝබාස් බොලීවියා එස්.ඒ (පීඊබී) නම් සංගතය නිල වශයෙන් පිහිටවනු ලැබුයේ බ්‍රසීලියානු සහ බොලිවියානු ආන්ඩුව මගින් බලශක්තිය ඒකාග්‍ර කිරීමේ ගිවිසුම් මත ය. ඩොලර් බිලියන අටක් වියදම් වූ තෙල් නල මාර්ගයක් බොලීවියාව සහ බ්‍රසීලය අතර තැනීම 1997 දී ආරම්භ විය. මේ සඳහා ප්‍රාග්ධනය යෙදවූයේ පීඊබී ආයතනය සහ බොලීවියාවේ රජය සතු බලශක්ති සමාගම වන වයිපීඑෆ්බීය යි.

1999 දී පෙට්‍රෝබාස් ආයතනය, බොලිවියාවේ සන්තා කෲස් ද ලා සියේරා නගරයේ ගිලර්මෝ එල්ඩර්බෙල් සහ කොචබම්බා නුවර ගුවාර්බර්තෝ විලාරූල් යන එරට ලොකුම පිරිපහදු දෙක අත්පත් කර ගෙන පෙට්‍රෝබාස් බොලිවියා රිෆයිනැසියෝන් නමින් නව සමාගමක් පිහිටුවී ය. ඉන්පසුව පෙට්‍රෝබාස් ආයතනය බොලිවියාවේ ලොකුම තෙල් සමාගම බවට පත්විය. 2005 දී මෙම ආයතනය බොලිවියාවේ දල ජාතික නිශ්පාදනයෙන් සියයට 18කට ද රට තුල එකතු කරන ලද බදුවලින් සියයට 24කට ද හිමිකම් කීවා ය. (*ඒජන්සියා ඕ ග්ලොබො* මැයි 10, 2007)

බොලිවියාවේ නිපද වූ පෙට්‍රල්වලින් සියයට සියයක් ද ඩීසල්වලින් සියයට 6ක් ද මෙම සමාගම නිපදවී ය. 2000 සිට එය බොලිවියාව තුල ප්‍රධාන තෙල් බෙදා හරින්නා බවට පත්වෙමින් තම වෙලඳ නාමය සහිත තෙල් බෙදා හරින ස්ථාන ජාලයක් ඇරඹී ය. බෙදා හරින ස්ථාන හතරක් ඔවුන්ට අයිති විය.

ජනාධිපති බවට පත් වී මාස ගනනාවක් ගිය පසු මැයි දිනයේ දී මොරාලේස් පෙට්‍රෝබාස් සමාගමේ බොලිවියානු පිරිපහදු ස්ථාන වෙත හමුදාව මෙහෙය විය. ඒ "ම්ලේච්ඡ ධනවාදයට" දශකයකටත් වඩා කාලයක් යටවී සිටීම අවසන් කරමින් එම අවස්ථාවේ සිට බොලිවියාව විසින් රටේ ආර්ථිකයේ පාලනය තම අතට ගන්නා බව ලෝකයට සංකේතාත්මකව ප්‍රකාශ කිරීමක් ලෙස ය.

මෙම ''ජාතිකවාදී'' ප්‍රකාශය ප්‍රතිඵලදායි කිරීම සඳහා, පෙට්‍රෝබාස් ආයතනයට අයිති බොලිවියාවේ පිහිටි පිරිපහදු දෙකෙහි පුද්ගලීකරනය අහෝසි කිරීම සඳහා වන්දි ගෙවීම පිනිස බොලිවියාව තුල තිබූ වත්කම්වල වටිනාකම තීන්දු කිරීම සම්බන්ධයෙන් මාස ගනනාවක් තිස්සේ බ්‍රසීලියානු රාජ්‍ය සතු සමාගම සමග බොලිවියානු ආන්ඩුව සාකච්ඡා කරමින් සිටියේ

ය. 1999 දී පෙට්‍රෝබාස් ආයතනය, පිරිපහදු දෙකට එ.ජ ඩොලර් මිලියන 104ක් ගෙවූ අතර ඉන්පසු එ.ජ. ඩොලර් මිලියන 30ක් පමන සංවර්ධන කටයුතු සඳහා වියදම් කලේ ය. ව්‍යවසායයන් දෙක සඳහා පෙට්‍රෝබාස් ආයතනය මුලින්ම ඉල්ලා සිටියේ එ.ජ.ඩොලර් මිලියන 200කි. එහෙත් මැයි 10 දා බ්‍රසීලියානු ආන්ඩුව බොලිවියාවේ යෝජිතයට එකඟ වී ආයතන දෙක නැවත මිලදී ගැනීම සඳහා එ. ජ. ඩොලර් මිලියන 112ක මිලකට එකඟ විය.

මොරාලේස් පැහැදිලි කල පරිදි "ජාතිකවාදී හැරීමේ" හිස් බව ආන්ඩුවේ මැයි 13 ප්‍රකාශය මගින් පෙන්නුම් කෙරුනි. මේ මගින් ආන්ඩුව බොලිවියානු රාජ්‍යය සතු තෙල් සමාගම වන වයිපීඇෆ්බීයට බොලිවියාව තුල නව තෙල් සහ ස්වභාවික ගෑස් නිධි ගවේෂනය සඳහා පුද්ගලික හා රාජ්‍ය මට්ටමේ විදේශීය සමාගම් සමග හවුල්වීමට බලය ලබා දුන්නේ ය. ඒ වන විට මොරාලේස් විදේශීය තෙල් සමාගම් සමග නව කොන්ත්‍රාත්තු 44ක් අත්සන් කර තිබින. ජාතිකවාදී වාගාලාප තිබියේ වුව මොරාලේස් මෙම අවස්ථාව ප්‍රයෝජනයට ගත්තේ නව හවුල් ව්‍යාපාර එකඟත්වයන් මගින් සිය ලාභවලට පූර්න නෛතික සහතික ලැබෙන බව පවසමින් තම රට තුල ආයෝජනය කල හැකි බවට විදේශීය සමාගම් අස්වැසීමයි.

පසු ගිය වසරේ සිට බොලිවියාවේ සොයා ගත් තෙල් නිධි කැනීම සඳහා වයිපීඑෆ්බී ආයතනය වෙනිසියුලාවේ රාජ්‍ය තෙල් සමාගම වන පීඩීවීඑස්ඒ ආයතනය සමග පෙට්රෝඅන්දිනා යන නමැති හවුල් ව්‍යාපාරය යටතේ ගිවිසුම් ගනනාවක් අත්සන් කලේ ය. (වයිපීඑෆ්බීයට කොටස් සියයට 49ක් ද පීඩීවිඇස්ඒයට කොටස් 51ක් ද වශයෙනි).

බොලිවියාවේ පෙට්රෝ-රසායනික කම්හල් තුනක් ගොඩනැගීම සඳහා ඩොලර් බිලියන 1.5ක් වියදම් කිරීමට ලතින් ඇමරිකාවේ ලොකුම ගොඩනැගිලි සමාගම වන බ්‍රසීලයේ නෝර්බර්ටෝ ඔඩ්බ්‍රෙක්ට් සමූහ කන්ඩායම සූදානම්ව සිටින බව මැයි 10 වැනිදා ඒජන්සියා ෆොල්නා නම් පුවත් සේවය හෙලිදරව් කලේ ය. මෙම පුවත් සේවයට අනුව, හවුල් ව්‍යාපාරයක් පිහිටුවීම සඳහා සමාගමේ විධායක නිලධාරීන් සහ බොලිවියානු ආන්ඩුව අතර දැනටමත් සාකච්ඡා කෙරීගන යයි. වෙනිසියුලාව තුල ඔඩ්බ්‍රෙක්ට් සමාගමේ හවුල්කාර සමාගම වූ ද ලතින් ඇමරිකාවේ ලොකුම පෙට්‍රෝ-රසායනික ව්‍යවසායක් වූ ද බ්‍රස්කෙම් සමාගම තුලින් ඉහත කී සමාගම තෙල් ඝන මීටර් මිලියන පහක් නිපදවීමට හැකි පොලිතීන් කම්හල් දෙකක් ද එතිලින් කම්හල් එකක් ද බොලිවියාව තුල ගොඩනගනු ඇත.

පෙට්‍රෝබ්‍රාස් සමාගමෙන් තෙල් ආයතන ආපසු මිල දී ගැනීම සඳහා සතුටුදායක එකඟත්වයක් ඇති කර ගැනීමෙන් පසුව, මොරාලේස්ට දැන් අවශ්‍ය වන්නේ රටේ ක්‍රියාත්මක වන ෂෙල් රෙප්සොල් සහ බීපී ආදී විශාල බහුජාතික සමාගම්වල කොටස් ආපසු මිල දී ගැනීම යි. මෙම සාකච්ඡා අවසන් වූ පසු බොලිවියානු ආන්ඩුව ප්‍රකාශ කර සිටින්නේ රටේ පොලොව යට ඇති තෙල් ධනය පාවිච්චි කිරීමේ සම්පූර්න පාලනය ආන්ඩුව විසින් ලබා ගන්නා බවත් ඒ අනුව පසු ගිය නව ලිබරල් ආන්ඩු විසින් විදේශීය ප්‍රාග්ධනය වෙත ප්‍රදානය කරනු ලැබූ "ජාතික ස්වාධිපත්‍යය" බොලිවියානු ජනතාවට ආපසු ලබා දෙන බවත් ය.

මූලික වශයෙන් ම මොරාලේස් බොලිවියාව තුල කරන්නේ 1999 දී ජනාධිපති ධූරය ලබා ගත් දින සිට ම හියුගෝ චාවේස් වෙනිසියුලාවේ කරන දෙය ම ය; එනම් උපරිම මහජන සහාය ලබා ගනු පිනිස අවශ්‍ය සමාජ ආධාර වැඩපිලිවෙලවල් ක්‍රියාත්මක කර ගනු වස් රට තුල ඇති විශාල තෙල් සම්පත් උපයෝගි කර ගැනීම ය.

බොලිවියාව දකුනු ඇමරිකාවේ ඉතාමත් ම දුප්පත් ම රටයි. ලතින් ඇමරිකාවේ සහ කැරිබියන් ප්‍රදේශය පිලිබඳ ආර්ථික කොමිසමේ (සීඊපීඒඑල්) 2006 වාර්ෂික සංඛ්‍යා ලේඛන වාර්තාවට අනුව වර්තමානයේ දී බොලිවියාවේ ජනගහනයෙන් සියයට 60කට වැඩි ප්‍රමානයක් (සියයට 63.9ක්) දරිද්‍රතා මට්ටමෙන් පහල ජීවත් වෙයි. සියයට 35ක් පමන නිරපේක්ෂ දරිද්‍රතා මට්ටමින් පහල ජීවත් වේ. ලතින් ඇමරිකාව සමස්තයක් ලෙස ගත් විට 2005 වසර සඳහා දරිද්‍රතා දර්ශකය සම්පූර්න ජනගහනයෙන් සියයට 39.8කි.

2005 ජනාධිපති තිලවරනයේ දී මොරාලේස් තම උද්ඝෝෂනය ගෙන ගියේ දුප්පත්කමට වැටී ඇති ඉහත සඳහන් බහුතරයට කරන ආයාචනයක් ලෙස ය. ස්වාභාවික සම්පත් සූරා කෑමේ යෙදී සිටින ආයතන ප්‍රතිජනසතු කිරීම පිලිබඳ උජාරු ප්‍රකාශන කරමින් දැන් ඔහු ආයාචනය කරන්නේ ද මෙම දුප්පත් මැතිවරන පදනමට ය.

මෙම ආයාචනයට සමාන්තරව සමස්ත පරිපාලන යාන්ත්‍රනය ම විධායකය අතේ ඒකරාශී කර ගැනීමක් සිදුවෙයි. මේ අනුව වෙනිසියුලාවේ චාවේස් මෙන්ම මොරාලේස් ද පාර්ලිමේන්තුව තුල විරුද්ධත්වය අහෝසි කර දැමීමට සමත් විය. ඔහු එය කලේ මාස් හෙවත් සමාජවාදය කරා ව්‍යාපාරය නමැති ඔහුගේ පක්ෂයේ ආධිපත්‍යය පවතින ආන්ඩුවට සම්පූර්න යටත් වූ ව්‍යවස්ථාදායකයක් ගොඩනැගීම මගිනි. ප්‍රථමයෙන් ම කොකේන් නමැති මත් ද්‍රව්‍ය වගා කිරීම අහෝසි කර දැමීමට එරෙහිව ආන්ඩුව ගත් පියවරයන්ට විරුද්ධව එම වගාව ආරක්ෂා කර ගැනීමට ඉදිරිපත් වීම මඟින් ඔහු මුල් වරට දේශපාලන වශයෙන් ජාතිකව ඉස්මතු වූයේ මෙම මාස් පක්ෂය තුලිනි.

මේ අර්ථයෙන් ගත් කල ඉවා මොරාලේස් " සමාජවාදය" කෙලින් ම සම්බන්ධ වී ඇත්තේ රාජ්‍යය ශක්තිමත් කිරීමට සහ රටේ ස්වාභාවික සම්පත් වැඩියෙන් සූරාකෑම මත ය. මෙම ව්‍යාජ සමාජවාදය කම්කරු පංතියේ ස්වාධීන බලය මත පදනම් වූවක් නොවේ. එය රටේ ආර්ථිකය අති මූලික පරිවර්තනයක් අන්තර්ගත කර ගත්තක් ද නොවේ. දේශීය ජනගහනයට රැකියා වැඩි සංඛ්‍යාවක් ඇති කරනවා වෙනුවට එය යෙදී ගෙන සිටින්නේ නුපුහුනු ශ්‍රමයට සුලු ඉඩකඩක් ලැබෙන අධි තාක්ෂනික ව්‍යවසායක් ගොඩනැගීම සඳහා ය.

අවසාන විග්‍රහයේ දී බලන විට ආන්ඩුවේ ක්‍රියාමාර්ගය ක්‍රියාත්මක වන්නේ ලෝක ධනේශ්වරයේ අවශ්‍යතා වෙනුවෙන් ය. එක පැත්තකින් රාජ්‍ය පාලනය නැවත ඇති කිරීම මඟින් ආන්ඩුව රට තුල ක්‍රියාත්මක වන ව්‍යාපාරවල පාලක අයිතියක් තමන්ට ලබා ගන්නේ නම් අනෙක් අතට ආන්ඩුව බහුජාතික සමාගම්වල අවශ්‍යතා අලුත් ආන්ඩුක්‍රම යටතේ ආරක්ෂා කෙරෙන බවට ප්‍රකාශ කිරීම මඟින් ඔවුන්ට නව සහතික කිරීම් ලබා දෙයි.

එම නිසා ප්‍රායෝගික වශයෙන් මොරාලේස්ගේ ආන්ඩුව කරන්නේ නව නෛතික ආරක්ෂන ක්‍රමයක් මත පරන කොන්ත්‍රාත්තු අලුත් බවට පත් කිරීම යි. දේශීය ප්‍රාග්ධනයේ පූර්න පාලනයට නතු වී තිබුනු ව්‍යවසායන් ආපසු මිල දී ගන්නා අතර ම එම ආන්ඩුව "මිශ්‍ර ප්‍රාග්ධනය" නමැති සූත්‍රය යටතේ හැම ව්‍යවසායකම ව්‍යාපාරික කොටස්වලින් කොටසක් නැවත වරක් පුද්ගලීකරනය කරයි.

ප්‍රාග්ධනය ප්‍රති මෙහෙයුම් කිරීමේ මෙම ක්‍රියාදාමය තුල දී නිසැකව ම ෂෙල් රෙප්සෝල් සහ බීපී වැනි අනෙකුත් බහු ජාතික ආයතන මෙන් ම පෙට්‍රෝබ්‍රාස් සමාගම ද පාඩු ලැබී ය. (මෙසේ වූයේ බ්‍රසීලියානු රාජ්‍ය සමාගම බොලීවියාව තුල කල වැඩකටයුතු එම සමාගමේ සමස්ත වැඩකටයුතුවලින් 3%ක් පමනක් වූ නිසා ය). එහෙත් ඒ හැටියෙන් ගත් කල ප්‍රාග්ධනයට අවාසියක් සිදු වී නැත. මක් නිසා ද යත් රටේ ධනේවර සූරාකෑම පිලිබඳ මෙම නව අදියර තුල දී රාජ්‍යය සෘජු පාලකයා බවට පත් වෙද්දී මොරාලේස් ඇත්ත වශයෙන් ම කරන්නේ බොලීවියාවේ ස්වාභාවික ධනය සූරා කෑමේ යෙදෙන ප්‍රාග්ධනයේ සංයුතිය වෙනස් කිරීම පමනක් වන නිසා ය.

රාජ්‍ය සමග එතරම් මිත්‍රශීලි නොවූ ධනපති කන්ඩායම් ඉවත් වී යනු ඇත. (පෙට්‍රෝබ්‍රාස් මෙන් කලින් තමන්ට ඉතාමත් වාසි සහගත වූ කොන්ත්‍රාත්තු සංශෝධනය කිරීමට නො කැමති අය) මේ අතර වෙනිසියුලාවේ හියුගෝ චාවේස් විසින් ඉදිරියට දැමුනු "විසි එක් වැනි සියවසේ සමාජවාදයේ" නමැති ජාතික සමාජවාදයේ පිටපතක් වූ නව "මොරාලේස් සමාජවාදයේ " " සහකරුවන් " ලෙස වෙනත් ධනපතියන් ඇතුලු වනු ඇත. ෂෙල් සහ වෙනත් සමාගම් ඉවත්ව යනු ඇත. එහෙත් හොඩ්බ්‍රෙෂ්ට් සහ පීඩීවීඇස්ඒ හා තවත් අය ඒ වෙනුවට ඉදිරිපත් වනු ඇත.

එක දෙයක් පැහැදිලි ය. මහා ප්‍රාග්ධනය සමග එකමුතු වූ ව්‍යාජ සමාජවාදයෙන් වාසි ලබනු ඇත්තේ බොලීවියානු ජනතාව නොවේ. සමහර විට බොලීවියව තුල දරිද්‍රතාව පිලිබඳව කැපී පෙනෙන සංඛ්‍යා ලේඛන ඉතා මඳ වශයෙන් අඩු වීමට ඉඩ ඇත. එහෙත් මධ්‍යම සහ දීර්ඝ කාලීනව ගත් කල මොරාලේස්ගේ ව්‍යාජ සමාජවාදය එහි ම පරස්පර විරෝධයන් තුලින් අහෝසි වී යනු ඇති අතර දැවැන්ත දරිද්‍රතාව සහ ජාත්‍යන්තර ප්‍රාග්ධනය මඟින් රට කොල්ලකෑමේ ප්‍රතිඵලයක් ලෙස බොලීවියානු ජනගහනය මුහුන දෙන කිසිම ව්‍යූහාත්මක ගැටලුවක් විසඳීමට එය අපොහොසත් වනු ඇත.